

**'මා නිවත්ත අභික්කම' - නො නැවත ඉදිරියට යවු**

| | | |
|---|---|---|
| **55 වන කාණ්ඩය** | **බු.ව. 2556 ඇසළ මස පුරපසළොස්වකදා ක්‍රි.ව. 2012 ජූලි මස 03 වන දා** | **03 වන කලබ** |

# ඇසළ සඳ දුටු දම්සක් අසිරිය

තරු රැස දිලිහි දිලිහී රොක් වෙයි ගුවනේ
ගහ කොළ නිසසල ව සුපහන් වනු පෙනුණේ
සිවුපා සතුන් සියොතුන් නිහඬ ය දෙරණේ
වෙසෙසක් වන සැටි යි අද මිගදා අරණේ

තුන් ලොව එකලු කළ තිලොවග බුදු පහන
සවනක් රසින් වැඩ හිඳ ඒ ඉසිපතන
දම්සක් දෙසුම අරඹන කල්හි ම සෙදින
දෙව්-බඹ සාදු නද එක නිනද ව ඇසිණා

සම්බුදු රැසින් මගෙ පැහැය ද තව දිලිණි
මුළු ලොවට ම දහම් ඇස විවර ව පෙනිණි
දම්සක් නැණින් දුක නිවනා මඟ ඇසිණි
එ අසිරි දැකගන්න පින් කළ බව හැඟිණි

**- අනඳ**



# ඇසළ සඳ එළියේ නැගුණු ප්‍රඥාලෝකය

බම්බලපිටිය සිරි වජිරාරාමවාසී
**පූජ්‍ය පිටිපන සාසනරතන හිමිපාණන් විසිනි.**

ඇසළ පුන් සඳ එක් පසෙකින් නැග එයි. ප්‍රභාශ්වර හිරුගේ ආලෝකය ක්‍රමයෙන් අඩු වී යයි. ඒ අදට වසර දෙදහස් හයසිය එකකට පෙර දිනයක වූ අසිරියකි. දඹදිව ඉසිපතන මිගදාය මහත් වූ ආශ්චර්යවත් සිදුවීමකට සැරසෙයි. හාත්පස ක්‍රමයෙන් අඳුර පැතිරේ. මිගදාය පුරා මලින් පිරී සුවඳ දසත පතුරයි. එක් අතෙකින් නිහඬ බව කුතුහලය දනවයි. අඳුර අතරින් එක් පසෙක තේජාන්විත ශ්‍රමණයන් වහන්සේ නමක් අබියස තවත් ශ්‍රමණයන් වහන්සේලා පස් නමක් වැඩ සිටිති. ආශ්චර්යයකි. දස දහසක් ලෝක ධාතුව කම්පා වූ සෙයකි. දෙවියන් ගේ දිව්‍යානුභාවයට වඩා වැඩි වූ ආලෝකයක් දසත පැතිරෙන්නට විය. කිමෙක් ද? ඒ මහා ශ්‍රමණ භවත් ගෞතමයන් තමන් වහන්සේ ගේ මංගල ධර්ම දේශනය සිදු කරන මොහොතයි. අමා ස්වරයක් දසත පැතිරේ. එය කන්කලු ය. මධුර ය. කනට මී බිඳු වැන්න. ඉදිරිපස සිටි පස්වග මහණුන් ගේ ජීවිතයේ භාග්‍යවන්ත මොහොත ය.

පින්වත් මහණෙනි, මේ ලොවෙහි යම් දෙයක් ඇත්ද, එහි සත්‍ය නම් එය දුකකි. ඒ දුක ඔබ මැනැවින් පිරිසිඳ දත යුතු ය. එසේ දුක මැනැවින් දැන ගැනීමත් ඒ දුකට හේතුවන

තෘෂ්ණාව ප්‍රහීණ කිරීමටත් වග බලා ගත යුතු ය. එසේ හට ගත් තෘෂ්ණාව දුක්ඛ නිරෝධය නම් නිවන සාක්ෂාත් කර ගැනීමෙන් සිඳ දැමිය යුතු ය. ඒ සඳහා සුදුසු පිළිවෙත් මඟ මම ඔබට අනුදනිමි. පින්වත්නි, ආර්ය අෂ්ටාංගික මාර්ගය නම් වූ ඒ ප්‍රතිපදා මාර්ගයේ ඔබ ගමන් කළ යුතු ය. මහණෙනි, මාගේ අවබෝධය මෙය වේ. මෙයින් නිවීම මම පිරිසිඳ දැන ගතිමි. ඔබගේ සැපත පිණිස මම මෙලෙස මෙම චතුරාර්ය සත්‍ය දේශනය කරමි. සැරසෙන්න, එම මාර්ගයෙහි ගමන් කරන්න.

මෙය වූ කලි උතුම් ධම්මචක්කප්පවත්තන සූත්‍රයේ කෙටි වූ අනාවරණයකි. මෙම ධර්මචක්‍රය තථාගත බුදුරජාණන් වහන්සේට පමණක් සුවිශේෂි දේශනාවකි. එතුමන් වහන්සේ දේශිත සෑම දහම් කරුණක් ම ධර්මචක්‍රයේ ඇතුළත් ය. ඒ හේතුවෙන් බෞද්ධ අප කාගේත් බෞද්ධ භාවයේ ප්‍රධාන සංකේතය ධර්මචක්‍රය බව අවිවාදයෙන් පිළිගැනෙන කාරණයකි.

ධර්මචක්‍රය පිළිබඳ සාධක සොයා ගැනීමට අපට ධර්මාශෝක රාජ්‍ය සමය දක්වා ගමන් කිරීමට සිදු වේ. අශෝක ස්තම්භවල සිංහ කුළුණුවල ධර්මචක්‍රයක් නිරූපණය කැර තිබේ. එහි ගරාදි සංඛ්‍යාව විසි හතරකි.

වර්තමානය වන විට නොයෙක් නිර්මාණශීලි අදහස්වලින් මේ ධර්මචක්‍රය හැඩ ගැන්වීමට බොහෝ දෙනා උත්සාහ ගනිති. නමුත් එසේ සිදු කරන විට ධර්මචක්‍රයෙන් ඉදිරිපත් කරන අදහස නිරවුල් වැ ප්‍රකාශවනවා ද යන්න සිතා බැලිය යුතු ය.

චක්‍රයක් නම් ඉදිරියට කරකවා යැවීමේ හැකියාව තිබිය යුතු ය. එහෙයින් ධර්මචක්‍රයෙහි ද මේ මූලික අරමුණ ගම්‍ය ව

පැවැතිය යුතු ය. මෙහි ගරාදි සංඛ්‍යාවේ ද යම් යම් වෙනස්කම් දක්නට ඇත. විටෙක ගරාදි අටක් ද, දොළසක් ද, දහසයක් ද, විසි හතරක් ද, තිස් දෙකක් ද ආදී වශයෙන් දැකිය හැකි ය.

පෙර සාධක පිළිබඳව අවධානය යොමු කිරීමෙන් මේ සියල්ල අතරින් වඩා නිවැරැදි ආකාරය සොයා ගැනීමට පෙරවදනක් ලබා ගත හැකි ය. ධර්මාශෝක රාජ්‍ය කාලයේ එතුමා මොග්ගලීපුත්ත මහරහතන් වහන්සේ ගේ අනුශාසනය යටතේ තම ධර්ම විජය සංග්‍රාමය සිදු කළ බව නොරහසකි. එසේ පැවැති යුගයක එතුමා බුදුරදුන් සම්බන්ධ විශේෂ ස්ථානයන්හි ස්ථාපිත කළ අශෝක ස්තම්භවල මෙම ධර්මචක්‍රය නිරූපණය කැර ඇති අතර ඒවායෙහි දැකිය හැක්කේ ගරාදි විසි හතරකි. එලෙස මහරහතන් වහන්සේ ගේ අනුශාසනා සහිතව නිර්මාණය වන්නට ඇතැයි සැලකිය හැකි මෙම සංකේතය බොහෝ දුරට අර්ථාන්විත ය. චතුරාර්ය සත්‍යයට අයත් දුක්ඛ සත්‍යයෙහි කරුණු දොළහ ද, සමුදය සත්‍යයෙහි තණ්හා ආකාර තුන ද, නිරෝධ සත්‍යයෙහි නිර්වාණය ද, මාර්ග සත්‍යයෙහි කරුණු අට ද එක්ව ගත් කල මෙම ධර්මචක්‍රයෙහි ගරාදි සංඛ්‍යාව විසිහතරක් වීම වඩා ධර්මානුකූල වේ.

එදා බෝ මැඩ දී බුදුරදුනට ඇති වූ දොළොස් ආකාර ප්‍රතිවේද ඥානය ද, ඉසිපතන මිගදායේ දී පහළ වූ දොළොස් ආකාර දේශනා ඥානය ද ''ධම්මචක්ක'' නම් වේ. මෙ කී විසි හතර ආකාර ඥානයෝ බුදු හිමියන් ගේ මැයි, මෙය සාරත්ථපකාසිනී නම් සංයුත්ත නිකාය අටුවාවේ සඳහන් කාරණයකි. මේ ආදී කරුණු පදනම් කැරගෙන මුතුන් මිත්තන් ධර්මචක්‍රය නිර්මාණයේ දී ගරාදි විසිහතර භාවිත කරන්නට යොමු වූහ යි සිතිය හැකි ය.

එහෙයින් දරුවනි, ගරාදි විසි හතරකින් සමන්විත කොන් පන්නා නොමැති පැහැදිලි චක්‍රාකාර ධර්මචක්‍රය අපිදු භාවිත කිරීම වඩාත් සුදුසු වේ. ධර්මානුකූල ද වේ.



# වැඩි පද ගැසීම

ගොතටුව චන්දන විහාරාධිපති
**පූජ්‍ය හිගුරේ පඤ්ඤාසේකර හිමිපාණන් විසිනි**

"ධමෙ ධමෙ නාතිධමෙ - අතිධන්තං හි පාපකං
ධන්තේන සතං ලද්ධං - අතිධන්තේන නාසිතං"

ගසනු ගසනු. වැඩි පද නො ගසනු. වැඩි පද ගැසීම නපුරෙකි. බෙර ගැසීමෙන් සියයක් ලද්දේ ය. වැඩි පද ගැසීමෙන් එය නැති කර ගත්තේ ය.

(භේරිවාද ජාතකය )

පෙර බරණැස් නුවර බඹදත් රජු රජ කරද්දී බෝසත්හු බෙර වයන කුලයෙහි ඉපදී කුඩා ගමක වාසය කළහ. හෙතෙම බරණැස් නුවර නැකැත් සැණකෙළියට ඝෝෂා කළායැයි අසා රඟහලේ දී බෙර වයා ධනය ගෙන එන්නෙමි යි පුතා රැගෙන එහි ගොස් බෙර වයා බොහෝ ධනය ලැබී ය. එය රැගෙන තමාගේ ගමට යන්නේ සොරුන් ගැවසෙන වනයකට පැමිණ නිතර බෙර වයන පුත්‍රයා වැළැක්වී ය. දරුව, නිරතුරු වාදනය නො කොට මඟට පිළිපන් ඉසුරුමතුන් වෙනුවෙන් වයන බෙරයක් මෙන් වරින් වර වාදනය කරන්න. පියා විසින් වළක්වනු ලබද්දීත් බෙර හඬින් ම පලවා හරිමි යි කියා නිරතුරුව ම වාදනය කළේ ය. සොරු පළමු කොට ම බෙර හඬ අසා ඉසුරුමතුන් සඳහා වයන බෙරයක් යැයි සලකා පලා ගොස් මේ බෙර ශබ්දය නිරතුරුව ම අසා ඉසුරුමතුන් ගේ

බෙර හඬ නොවේ යැයි අවුත් විමසා දෙදෙනකු පමණක් දැක ඔවුන් තළා පෙළා ධනය පැහැර ගත්හ. බෝසත්හු අප මේ ධනය ලැබුවේ මහත් අමාරුවෙනි. නිරතුරුව බෙර වාදනය නිසා ධනය විනාශ කළේයැයි කියා ඉහත සඳහන් ගාථාව කීහ.

මෙය පියා ගේ වචනය නො අසා අකීකරු පුතා විසින් වැඩි පද ගසා නිරතුරු වාදනය කිරීමෙන් සිදු වූ විපතක් බව පැහැදිලි වේ. එනිසා බෝසත් දුවේ පුතේ, අපේ හඬ අපේ කථාව අන් අයට කරදරයක් නොවන පරිදි සිදු කරන්නට වග බලා ගත යුතු වේ. සභාවක ඉතා වැදගත් දෙයක් කියන්නේ නමුත් එය වැඩි හඬ නගා කෑ කොස්සන් ගසා කියන විට වැදගත් දෙයෙහි ඇති වටිනාකම නැති වී යන්නට පුළුවනි.

යහපත් කථාව උතුම් යැයි සත්පුරුෂයෝ කීහ. ධර්මය ම කියන්නේ ය. අධර්මය නො කියන්නේ ය. ප්‍රිය දෙයක් ම කියන්නේ ය. අප්‍රිය දෙයක් නො කියන්නේ ය. සත්‍යයක් ම කියන්නේ ය. අසත්‍යයක් නො කියන්නේ ය. යමෙක් නින්දා කළ යුතු තැනැත්තාට ප්‍රශංසා කෙරේ ද, ප්‍රශංසා කළ යුතු තැනැත්තාට නින්දා කෙරේ ද, ඔහු කටින් පව් රැස් කරයි. ඒ පව නිසා ඔහු සැප නො ලබයි. යම් කථාවකින් තමා නො තවා ද අනුන් නො තවා ද, එබඳු කථාවක් ම කියන්න. ඒකාන්තයෙන් ඒ කථාව යහපත් වේ. තමාගේ කථාව තවත් කෙනෙකුට පාලනය කළ නොහැකි ය. එය පාලනය කළ හැක්කේ තමාට පමණ ය. එනිසාය කියමනක් තිබෙන්නේ ''රට වට කර වැට බැන්දත්, කට වට කර වැට බැඳිය නොහැකි ය කියා. '' යමකු ඉක්මන් වැඩක යෙදී සිටිනු දුටු විට ඔහු හා අවසර නැතිව කථා කිරීම සුදුසු නැත. එයින් ඔහු ගේ වැඩට බාධා ඇති වනු පමණක් නොව, ඔහු තදින් කිපෙන්නට ද පිළිවන. මේ කරුණු හොඳින් සිතට ගෙන වැඩි කථා නො කොට වැඩකට ඇති කථාවක් කරන්නට බෝසත් දරුවෝ සිතට ගනිත්වා.. !



### සිරිත් මුතුහර -03

# බාහුසච්චං ච සිප්පං ච විනයෝ ච සුසික්ඛිතෝ

**“ගුරු සීයා” විසිනි**

නූතන අධ්‍යාපන විද්‍යාවේදීන් සඳහන් කැර ඇති පරිදි අධ්‍යාපන ක්‍රියාවලියෙහි අරමුණු හෙවත් පරමාර්ථ තුනක් සඳහන් වෙයි. ඒවා නම් දැනුම, කුශලතා, ආකල්ප යන ක්ෂේත්‍ර තුන දියුණු කිරීම යි. අද එකී අධ්‍යාපන පරමාර්ථ යහපත් ''මිනිසකු නිර්මාණය කිරීම'' දක්වා වර්ධනය වී ඇත.

සංසාරගත කිසියම් කර්ම බීජයක් රැගෙන මෙ ලොව උපදින මිනිසාට නව ගමන් මඟක් සකස් කැර දෙනු ලබන්නේ අධ්‍යාපනයෙනි. එහි මූලික ආරම්භය මවුපිය ඇසුරින් ගෙදර දොර පරිසරයෙහි දී ළමයා ලබන්නේ ය. පසුව එය පාසලේ දී පත - පොත ඉගැනීමෙන් හා විවිධ ක්‍රියාකාරකම්වලින් ලබ යි.

‘මිනිසා හැදීම’ ලොකු ම පින්කම ලෙස බුදු සමයෙහි අවධාරණය කැරේ. මිනිසා හැදීම නම් මිනිහා ගේ මනස හැදීම යි. මේ කාර්යය අධ්‍යාපනයේ මූලික පරමාධ්‍යාශය වෙයි. එය අභ්‍යන්තර සහ බාහිර වශයෙන් දෙවැදෑරුම් කොට ඵලදායී කැරගත හැකි ය.

මීට වසර දෙ දහස් හයසියයකට පෙර දේශිත බුද්ධ ධර්මයෙහි වර්තමානයේ පිළිගත් සංවර්ධනාත්මක අධ්‍යාපන

සංකල්ප ප්‍රකාශ කැර තිබීම පුදුමය දනවන කරුණකි. තථාගත ධර්මය අකාලික දේශනයක් වන හෙයින් විද්‍යා තාක්‍ෂණය දියුණු වත්මන්හි වුව ද එහි ප්‍රායෝගික භාවිතය ඉහළ අගයක පවතී.

මෙහි මාතෘකාවෙහි පෙනෙන මංගල සූත්‍රයේ ඉගැන්වෙන කරුණු තුන යට කී කරුණට නිදසුනකි. දැනුම දියුණු කැරගැනීම හෙවත් උගත්කම ''බාහුසච්ච'' යන්නෙන් අදහස් වේ. කුශලතා දියුණුව හෙවත් ශිල්පීය හැකියාව ''සිප්පං'' යන්නෙන් අවධාරණය වේ. මේ දෙ කරුණ ම වඩාත් අර්ථාන්විත වන්නේ හැදියාව ද ඊට එක් වූ තැන ය. ''විනයෝ ච සුසික්ඛිතෝ'' යනුවෙන් හැදියාව හැඳින්වෙන වචන දෙකක් ම යොදා තිබීම අවධානයට ලක් විය යුතු කරුණකි. තමාගේ සහ අනුන්ගේ යහපතට හේතු වන චර්යාවන් ඇති කැර ගැනීමත් ඊට අදාළ වන මනා ශික්‍ෂණයත් පුද්ගලයකු සතුව තිබීමේ වැදගත්කම මෙම වචනවලින් උද්දීපනය කැර ඇති අයුරු පිරික්සා බැලීම වැදගති.

වර්තමාන අධ්‍යාපනයේ ගමන් මඟ දෙස බලන විට අපට පැහැදිලිව පෙනෙන දෙයක් නම්, දැනුම ලබාගන්නට දරන දෘඪ උත්සාහයත්, එ මඟින් තරගකාරී ව අසීමිත ආශාවන් කරා හඹායමින් චිත්ත පාලනයක් නො මැතිව උනුන් පරයා දුවන මිනිසා ගේ අපචර්යා ගමන් විලාසය යි.

වත්මන් ලෝකයා මුහුණ පාන ආර්ථික අර්බුදය, සමාජ ගැටලු, භූගෝලීය උණුසුම් වීම හා පාරිසරික විපර්යාස, සෞඛ්‍ය ප්‍රශ්න, මන්දපෝෂණය හා සදාචාර පරිහානි යන විවිධ සංකීර්ණ ප්‍රශ්නවලට හේතු විමසන කල මිනිසියාව හෙවත් මනුෂ්‍යයත්වය අමතක කොට සිදු කැරෙන වර්තමාන අධ්‍යාපන රටාව ඊට ප්‍රබල ලෙස බලපා ඇති බව අපට තේරුම් ගත හැකි වෙයි.

එ බැවින් මේ තරම් වටිනා ආර්ය ධර්ම මාර්ගයකට හිමි කම් කියන, සියවස් ගණනාවක් පැරැණි සංස්කෘතියකට උරුමකම් කියන, සම්පත් බහුල ශ්‍රී ලංකාවේ අපට ආවේණික මාර්ගයෙන් පිට පැන ගමන් කිරීම නිසා අනෙක් රටවල් මුහුණපා ඇති ගැටලුවලට අප රටවැසියනට ද මුහුණ පාන්නට සිදු වීම ඛේදවාචකයකි. එ හෙයින් මානව දයාවෙන් පිරිපුන් ජන සමාජයක් ගොඩනැඟීමේ කාර්යය සපුරා ගැනීමට අධ්‍යාපනය තරම් ප්‍රබල මාර්ගයක් වෙන නැත.

කරුණු මෙසේ වන හෙයින් මංගල සූත්‍රයේ ප්‍රකාශිත දැනුම - ශිල්පීය කුශලතා හා ශික්ෂිත චර්යාවලින් පිරිපුන් දරුවන් හැදීමේ බෞද්ධ අධ්‍යාපන ක්‍රමවේදය පාසලින් ම ඇරඹෙන්නේ නම් මිනිසා මිනිසා දෙස පමණක් නොව සියලු සතුන් කෙරෙහි ම දයාලු වන යහපත් සුවපත් අනාගතයක් අපට ඉක්මනින් ම උදා කැරගත හැකි වනු ඇත.

කොර ගස ගසා යන අසරුවකුට අනුව<br>
පෙර අසකුත් ගිය සැටි සලකා ගනුව<br>
නිරතුරු පෙනෙන වැඩිහිටියන් ගති අනුව<br>
වරදට හොඳට දරුවෝ හැරෙතැයි දනුව

**පැළෑණේ මහ නා හිමි**



# සදාචාර සමාජයකට දායක වෙමු

කොස්ගම බොල්ලතාව ශ්‍රී සුභද්‍රා දහම් පාසලේ උප ප්‍රධානාචාර්යානී
**ශාස්ත්‍රපති එච්. එම්. සුජාතා නාලිනි මහත්මිය විසිනි.**

අප දන්නා පමණට සෑම ආගමකට ම පොදු වූ ධර්මතා තුනක් දක්නට ලැබේ. ඒ, පුද පූජා පැවැත්වීම් ආදී ශාන්ති කර්ම, තමාගේත් සමස්ත සමාජයේත් ප්‍රගතියට හේතුවන ඇවතුම් පැවැතුම් ආදී ආචාර ධර්ම හා බුදු දහමේ නම් ආධ්‍යාත්මික දියුණුව සලසාලන දාර්ශනික පදනම යි.

මෙයින් යහපත් මිනිසෙකු, යහපත් සමාජයක් බිහිකරලීමට සත් හෙවත් යහපත් ආචාර ධර්ම පද්ධතියක් අත්‍යවශ්‍ය වේ. හොඳ නරක තේරුම් ගැනීම සඳහා දහමේ එන කරුණු තේරුම් ගෙන, ඒවා මැනැවින් සිත්හි ධාරණය කර, ඒ අනුව දිවි පැවැත්වීමෙන් සදාචාර සම්පන්න පුද්ගලයකු වීමට ඕනෑම කෙනකුට පුළුවන.

ගිහි අපට ඒ බව පෙන්වා දෙන ඉතා වටිනා සූත්‍ර ධර්මයකි, සිගාලෝවාද සූත්‍රය. ‘ගිහිවිනය’ නමින් ද මෙම සූත්‍රය හැඳින්වේ. එයින් පෙනීයන්නේ මිනිසා සදාචාර සම්පන්න, සීල සම්පන්න කිරීමේලා කෙතරම් පිටිවහලක් මෙ මගින් ලැබේ ද යන්නයි.

බුදුරදුන් මේ සූත්‍රය දේශනා කළේ, සිගාල නම් ගෘහපතියාට ය. ඔහුගේ පියා සතළිස් කෝටියක තැන්පත් මුදලක් ඇති

මහා ධනවතෙකි. මවු පිය දෙපළ ම සෝවාන් මගඵල ලැබූ බුදුරදුන් කෙරෙහි අචල ශ්‍රද්ධාවෙන් යුත්, බෞද්ධෝපාසකයන් දෙදෙනෙකි. එහෙත් සිගාල බුදුන් දැකීමට හෝ, දහම් ඇසීමට හෝ මහ සඟ රුවන ඇසුරු කිරීමට හෝ ලැදියාවක් දක්වූ කෙනෙක් නොවේ. ඔහු දහමට යොමු කරවීමට දෙමවුපියන් විසින් දැඩි උත්සාහයක් ගනු ලැබුව ද, ඒ වෑයම නිෂ්ඵල වූයෙන් කවදා කාගෙන් හෝ නිවැරැදි දහම ඉගෙන ගනු ඇතැයි සිතූ පියා මරණාසන්න අවස්ථාවේ දී පුතු අමතා සදිසා නමස්කාරයේ යෙදෙන්නැයි අවවාද කරමින් අවසන් හුස්ම හෙළුවේ ය.

මරණ මඤ්චකයේ දී යමකු විසින් දෙන ඔවදන ජීවිතාන්තය දක්වා ම සිහි කළ යුතු ය. කඩ නොකළ යුතු ය. අවසන් මොහොතේ පියා විසින් දෙන ලද අවවාදය කඩ නොකොට පිළිපැදිය යුතු යැයි සිතූ සිගාල ද පසුදා සිට ම සදිසා නමස්කාරයේ යෙදුණේ ය. දිනක් උදෑසන ලොව බලා වදාරන බුදුරදුන් දිය නා තෙත වස්ත්‍ර සහිතව ඒ ඒ දිසාවන්ට හැරෙමින් වඳින සිගාල දැක එතැනට වැඩම කොට ආර්ය විනයෙහි සදිසා නමස්කාර පිළිවෙත මෙසේ නොවේ යැයි වදාළහ. එසේනම් කෙසේදැයි ඔහු විසින් විමසන ලද කල්හි 'එසේනම් අසන්න. අසා මැනැවින් සිත්හි ධාරණය කර ගන්න.' (සුණාහි, සාධුකං මනසි කරෝහි) යි මේ සූත්‍ර ධර්මය වදාළ සේක.

මෙහි පළමුවෙන් ම ඉගැන්වෙන්නේ තුදුස් ලාමක ධර්ම කොට්ඨාසයයි. සතර කර්ම ක්ලේශ, සතර අගති හා භෝග විනාශ මුඛ සය යන මෙයින් යම් කිසිවෙක් ඈත් වෙයි ද හෙතෙම දිවි මග සාර්ථක කර ගන්නා නිවරැදි මගට පිළිපන් දෙලොව දියුණුව සලසා ගත් කෙනෙකු වන බව බුදුරදුන් විසින් දේශනා කරන ලදි. ගිහියන් වන අපත් අපගේ මෙලොව දියුණුව නසා පරලොව දියුණුව වනසාලන මේ තුදුස් ලාමක ධර්ම මොනවාදැයි විමසා බලමු.

පරපණ නැසීම, නුදුන් දේ ගැනීම, වැරදි කම්සැප සෙවීම හා මුසා බස් දෙඩීම කර්ම ක්ලේශ සතරයි. ප්‍රාණඝාතය පංච සීල ප්‍රතිපදාවෙහි එන පළමු වන ශික්‍ෂාපදයයි. මෙලොව වෙසෙන සෑම සත්ත්වයෙක් ම මරණයට බිය වේ. තමාද දඬුවමට මරණයට බිය වේ. එසේනම් තමා උපමා වශයෙන් ගෙන (අත්තානං උපමං කත්වා) සත්ත්ව හිංසාවෙන්, සත්ත්ව ඝාතනයෙන් වැළැකී සියලු සතුන් කෙරෙහි මෛත්‍රිය, කරුණාව, දයාව, අනුකම්පාව දක්වන්නේ නම් එයින් තමාට මහත් සෙතක් වන අතර සමාජයටත් උදාර සේවයක් සිදු වේ.

සොරකම හෙවත් අන්සතු දේ ගැනීම නිසා සමාජය තුළ විවිධ අන්දමේ ගැටලුකාරී තත්ත්වයක් පැන නැඟී ඇති බව වත්මන් සමාජය දෙස බලන විට වුව අපට පැහැදිලිව පෙනෙන කරුණකි. හොර කිරීම් මිනුම් ආදී අංශවලින්ද අද සොරකම සමාජ ගත වී ඇති බව පෙනේ. බුදුරදුන් එදා සිගාල ගෘහපතියාට දේශනා කළේ, සොරකමින් වැළැකීම පුද්ගලයකු විසින් රැකිය යුතු උසස් පිළිවෙතක් බවයි.

ගිහියන්ට කාමසම්පත් අනුභවය බුදු දහමින් ප්‍රතික්‍ෂේප නොවේ. එහෙත් යමෙක් එහි වැරැදි අන්දමින් යෙදෙන්නේ නම් එය පිරිහීමේ ලක්‍ෂණයක් බව බුදුහු වදාළහ. ගින්නට දර සේ, මහසමුදුරට ජලය සේ අපේ ඇස කන නාසාදී පංච ඉන්ද්‍රියන්ට රූප ශබ්දාදී අරමුණු කෙතෙක් දුන්න ද සෑහීමකට පත් නොවේ. එනිසා පසිඳුරන් පිනවීමේ දී අප බුද්ධිමත් විය යුතු ය. දෛනික ජීවිතයට බාධා නොවන සේ සමාජ ආචාර ධර්මයන්ට පටහැනි නොවන සේ කාම සම්පත් අනුභව කිරීමට අප බුද්ධිමත් විය යුතු ය.

පංචසීල ප්‍රතිපදාවට අයත් මුසාවාදයත් පුද්ගලයාගේ දෙලොව දියුණුව වනසාලන ලාමක පාප ධර්මයකි. බොරුව එකිනෙකා අතර සුහදතාව බිඳලයි. ඔවුනොවුන් මහත්

පීඩාවට, අසහනයට පත් කරවයි. අනුන් පමණක් නොව තමන් ද විනාශයට පත් කරවන බොරුව, දෙපැත්ත කැපෙන කෙටේරියක් බවයි බුදුදහමෙහි සඳහන් වන්නේ.

ඡන්ද ද්වේෂ, භය මෝහ හෙවත් දැඩි ඇල්ම, අමනාපය, බිය හා මෝඩකම නිසා අගතියට යෑම සාධාරණය යටකොට අසාධාරණය දිනවන පහත් ලාමක ක්‍රියා බවයි, බුදුරදුන් වදාළේ. මේ නිසා ජන සමාජය තුළ විවිධ ගැටළු ප්‍රශ්න පැන නැඟේ. ජන ජීවිතය හා බැඳි සාමකාමී බව විනාශ වේ. සමාජය පරිහානිය කරාම ගමන් කරයි. බුද්ධිමත්ව කටයුතු කිරීමෙන් අගතියට නොයා මෙලොව දියුණුව පරලොව සුගතිය ළඟාකර ගැනීමට අප ද සිතට ගත යුතු ය.

පුද්ගල මෙන් ම සමාජ පරිහානිය ද සිදුවන අනෙක් ලාමක ධර්මය සේ බුදුරදුන් සිගාල ගෘහපතියාට පෙන්වා වදාළේ, ධනය හෙවත් භෝග සම්පත් විනාශ වන කරුණු සයයි. රහමෙර පානය, අවේලාවේ වීථි සංචාරය, නැටුම් ගැයුම් වැයුම් සඳහා කාලය කා දැමීම, විවිධාකාරයේ සූදු ක්‍රීඩාවන්හි නිරත වීමත්, පාප මිත්‍රයන් හා එක්වීමත්, කම්මැළිවීමත් පරිහානියට හේතු වේ. මේ ආදී කටයුතුවල යෙදුණු කෙනෙකුට කෙසේවත් නව දියුණුවක් සලසා ගැනීමට හෝ ලබා ඇති දියුණුව පවත්වා ගැනීමට හෝ නොහැකි වේ. යමෙක් මේ ලාමක ධර්මයන්ගෙන් ඈත් වන්නේ ද හෙතෙම යහපත් ආර්ථික දියුණුවක් සලසා ගන්නා අතර ම, යහපත් ගිහි ජීවිතයක් ගෙවමින් සමාජයට අර්ථයක් ම සිදු  කරන්නේ ය.

සිගාල ගෘහපතියාට මේ තුදුස් ලාමක ධර්ම දේශනා කිරීමෙන්, බුදුරදුන් බලාපොරොත්තු වූයේ පුද්ගලයාගේ මෙලොව ජීවිතය පරිහානියෙන් වළක්වා, සාර්ථක මාවතට යොමු කරවීමයි. ඒ අසා සිටි සිගාල තරුණ ගෘහපතියා අතිශයින් ම පැහැදුණේ ය. යටිකුරු කළ දෙයක් උඩුකුරු කර දැක්වූවා සේ, වසා තැබූ දෙයක් විවර කර දැක්වූවා සේ,

අඳුරේ සිටි තමාට නිවැරැදි මග පෙන්වූවා සේ, දිවි කතර මංමුළා වී සිටි තමාට දිවිමග නිවැරැදි කර ගැනීම සඳහා වූ දහම් පහනක් දැල්වූවා සේ ධර්මය අවබෝධ කරගත් බව ඉතා සතුටින් ප්‍රකාශ කෙළේ ය.

එදා ලෝභ ද්වේෂ මෝහාදී අකුසල මූලයන්ගෙන් වෙළී පැටලී සිටි සිගාල දහම දැන දහමට අනුව දිවිමග සකස් කර ගත්තා සේ අපිත් කෙලෙස් දහමින් වැළකී නිකෙලෙස් දහමෙහි යෙදී මෙලොව පරලොව සැප සලසා උතුම් වූ නිවන අවබෝධ කර ගැනීම සඳහා වහ වහා උත්සුක වෙමු.

සැමට සම්බුදු සරණයි.

"මනුෂ්‍යයා කියන්නේ උසස් මනසක් ඇති කෙනෙක්. උසස් මනසක් ඇත්නම් ඒ තැනැත්තාට හැකිවිය යුතුයි අනුන් ගේ කර්ම දෝතට නොගෙන තමන්ගේ කර්මත් ලෙහා ගෙන මේ සසරින් නික්මෙන්නට මග හදා ගන්නට. එහෙම කළ නොහැකි වෙන්නේ තමන් ශීල භාවනාවෙන් පිරිහිලා හීන දීන වෙන නිසයි. ඒ නිසා බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා ශීල භාවනාව යම්කිසි කෙනෙකු ප්‍රගුණ කළොත් තමයි ඒ තැනැත්තා කර්ම ශක්තිය අබිබවා යන්නට හැකි මහේශාක්‍ය භාවය ඇති කර ගන්නේ."

**පූජ්‍ය කුකුල්පනේ සුදස්සි හිමිපාණන් වහන්සේ**
("කර්මය අබිබවා යන මහේශාක්‍ය බව" කෘතියෙනි)



# “විද්ද ඊතලයයි, අතපසු වූ වචනයයි ආපසු ගත නොහැකි ය”

ත්‍රිකුණාමලේ මිහිඳුපුර විද්‍යාලයයේ විදුහල්පති
**උදාන ගීගනගේ මහතා විසිනි**

ආදර දරුවනේ,

මුළු මහත් ශ්‍රී ලංකාව පුරා ම විසිරුණු විවිධ ගම් දනව්වල ජීවත් වන ළමා ඔබ ඉහත වැකිය අඩු වැඩි වශයෙන් සවන් පත් කොට ඇතැයි සිතමි. සමාජ සම්බන්ධතා ගොඩනැගීමේ මාධ්‍යයක් වශයෙන් ‘වචනය’ ප්‍රබල කාර්යයක් ඉටු කරයි. අපේ වැඩිහිටි සමාජයේ ඇතැම් පුද්ගලයන් ගේ කතා ව්‍යවහාරය ඊතල වගේ සැරයි, තියුණුයි. ඒ ඔවුන් තම ළමා කාලය සුභාෂිතයෙන් බැහැර ව ගෙවූ නිසයි. ඒ නිසා තමයි අප වචන භාවිතයේ දී පරිස්සම් විය යුතු වන්නේ. හරියට දුන්නෙන් මිදුණු ඊයක් වගේ. අපේ මුවින් පිටවුණ නොහික්මුණු වදනක් නැවත ඇදලා ගන්න බැහැ. හරියට හදවතේ ඇනුණ හීය නැවත ඇද ගැනීමේ දී තව තවත් පැරෙනවා වගේ. අපේ පාසල්වල ඇතැම් විට පංතියේ ම ළමයින් අතරත් පංති පංති අතරත් පාසල් අතරත් ආදී වශයෙන් බොහෝ අරගල රණ්ඩු සරුවල්වලට මූලික වී තිබෙන්නේ බොහෝ විට අපේ වචන භාවිතයේ දුර්වලතා නිසායි. විශේෂයෙන් ම අප සමාජයක් ලෙස එකට එක්ව ජීවත් වීමේ දී පාසල් පංති කාමරයෙන් ලබන හුරුව වෙනත් සමාජානුයෝගී තත්ත්වයත් සමග කටයුතු

කිරීමට විශාල පිටුබලයක් වෙනවා. හැම දෙයක් ම තර්කයට නතුකර ජය ලබන්නට උත්සාහ කිරීම එතරම් හොඳ බුද්ධි ගෝචර ක්‍රියාවක් නොවේ. මෙවැනි තත්ත්වයන් තුළ පාසල් අධ්‍යාපනයෙන් පසු විශ්වවිද්‍යාල අධ්‍යාපනයට ප්‍රවේශ වන දරුවා අරගල සමුදායකට වගකිව යුතු මුල් පෙළේ අයකු බවට පත් වේ.

ඕනෑම ගැටලුවක් අපට සාකච්ඡාවෙන්, සම්මුතියෙන් විසඳා ගත හැකි ය. පාසල්වල, විශ්වවිද්‍යාලවල සිසු - සිසුන් අතර සිසුන් - ගුරුවරුන් අතර සිදුවන නොයෙක් ආරවුල් නිතර ජනමාධ්‍ය මඟින් ඔබට, අපට අසන්නට ලැබෙනවා. බාගදා මෙවන් ගැටලුවකට මුළුදුන් කරුණ, සුළු වචනයක එහා මෙහා වීමක් විය හැකියි. මේ නිසා සිසු දරුවන් වගේ ම වත්මන් ගුරු පරපුරද තමන් කරන කියන දෑ බුද්ධියෙන් විමසා ප්‍රකාශ කළ යුතු යි. එවිට සමාජයට දායාද වන සාර්ථක පුරවැසියන් තුළින් අප සැමට නව ලොව ජය ජයගත හැකි වේ වි.



"යම්කිසි අඥානයෙක් තමාගේ වැරැදි අදහස්
කියා දැහැමි දිවිපෙවෙත් ඇති ආර්ය වූ
රහතන් ගේ අනුශාසනයක් වළකයි ද, එය
උණගසේ පල හට ගැනීම මෙන් තමාගේ ම
විනාශයට හේතු වෙයි"

(**ධම්මපදය** - ආත්ම වර්ගය)



# කාලිංග ජාතකය

කොළඹ විශාඛා විද්‍යාලයේ විශ්‍රාමලත් ආචාර්යාණි
**ලක්ෂ්මී පෙරේරා මහත්මිය**

අප සම්මා සම්බුදුරජාණන් වහන්සේ දෙව්රම් වෙහෙර වැඩ වාසය කරන කල, ආනන්ද තෙරණුවන් ගේ මූලිකත්වයෙන් මහා බෝධි පූජාවක් පැවැත්විණ. මෙම මහා බෝධි පූජාව අරබයා බුදුරජාණන් වහන්සේ කාලිංග ජාතකය දෙසූ සේක.

මෙම බෝධි පූජාව පැවැත්වීමට හේතුවක් විය. බුදුරජාණන් වහන්සේ දිවැසින් ලොව දෙස බලා අසරණ මිනිසුනට පිහිටවීමටත්, දානමාන පිංකම් සඳහාත් ගම්දනව් බලා වැඩම කළහ. එහෙයින් විහාරස්ථානයට පැමිණෙන සැදැහැවතුනට බුදු පුදට අවස්ථාවක් නොලැබුණි. මෙම සැදැහැවතුනට පිහිටවීමට සිතූ ආනන්ද තෙරණුවෝ බුදුරජාණන් වහන්සේ ගේ අනුදැනුම මත ඇසතු බෝ පැළයක් රෝපණය කළහ. බුදු සමිඳුන් විහාරස්ථානයේ නොසිටි අවස්ථාවල උන්වහන්සේ වෙනුවෙන් බෝධි පූජා පැවැත්වූහ. බෝධි රෝපණය හා බෝධි පූජා පැවැත්වීම පිළිබඳව අනෙක් භික්ෂූහු ආනන්ද තෙරණුවන් අගය කළහ. මෙය දැනගත් බුදුරජාණන් වහන්සේ මෙකල පමණක් නොව පෙර ආත්මවල දී පවා ආනන්ද තෙරණුවන් බෝධි පූජා පැවැත්වූ බව වදාරා මෙම ජාතකය වදාළ සේක.

යටගිය දවස දඹදිව, කළිඟු රට දන්ත පුරයෙහි රජ කළ කාලිංග රජුට මහා කාලිංග, චූල කාලිංග නමින් පුතුන්

දෙදෙනෙක් වූහ. පිය රජුට පසුව මහා කාලිංග රජ විය. නමුත් නිමිති කියන්නන් පැවසූයේ, චූල කාලිංග රජු ඉතා වාසනාවන්ත බවත් මතු දිනක සක්විති රජවන පුත් කුමරෙකු ගේ පියාවන බවත් ය. තමාගේ පිය පදවිය ගැන මාන්නයෙන් පසු වූ චූල කාලිංග කුමරු හා මහා කාලිංග රජු අතර විරසකයක් ඇති විය. එම නිසා රටින් පිටවූ චූල කාලිංග කුමරු වනගත වී ගංගාවක් අසබඩ හුදෙකලා ජීවිතයක් ගත කළේ ය.

දඹදිව මදුරට සාගල නම් නුවර පාලනය කළ මදුරට රජතුමාට රුවැති දියණියක් සිටියා ය. නිමිතිකරුවෝ ඇය ගේ විවාහයෙන් පසු ඉපදෙන කුමරා සක්විති රජවන බව පැවසූහ. මෙම ආරංචියට දඹදිව කුමාරවරු ඇයගේ අත පතා පැමිණියත්, එක් අයෙකුට දියණිය විවාහ කරදුන් විට අනෙක් කුමරුවන් අමනාප වෙති යි සිතූ මදුරට රජ , තම රුවැති දියණියත්, බිසවත් කැටුව වනගත විය. ඔවුන් ද ගංගාව අසබඩ නිවසක් තනා වාසය කළහ.

එක් දිනක් දූ කුමරිය ගඟ අසබඩ මල් නෙළමින් සිටිය දී චූල කාලිංග කුමරු මුණ ගැසී මිතු දමක් ඇති විය. නොබෝ කලෙකින් දෙදෙනා විවාහ වී පින්වත් කුමරෙකු ගේ මවුපියන් බවට පත් වූහ. තරුණ වියට එළඹ මෙම කුමරු තම මවු රට බලා ගොස්, පුරෝහිත ඇමතිඳු ගේ උදව් උපදෙස් මත කළිඟු රට රජවිය. පසුව නිමිති කරුවන් ගේ අනාවැකි සඵල කරමින් මෙම පුත් කුමරු සක්විති කළිඟු රජ බවට පත්විය.

දිනෙක සක්විති කළිඟු රජුහට මඟුල් ඇතු පිට ශ්‍රී මහා බෝ සමිඳුන් අසලින් ගමන් කරන්නට සිදු විය. එහෙත් ඇතු පසු බසින්නට විය. රජුට ගමන යෑමට නොහැකි විය. රජතුමා ඇතුට යෑමට නොහැක්කේ මක්නිසාද යනුවෙන් පුරෝහිත බමුණාගෙන් විමසීය.

''උතුම් ශ්‍රී මහා බෝධිය වැඩ සිටින මණ්ඩපයෙහි සියලු බුදුරජාණන් වහන්සේලා බුදුවූහ. එම නිසා එතැනට ඉහළින්

කිසිවෙකුට ගමන් කළ නොහැක '' පුරෝහිත බමුණා රජතුමාට පහදා දුනි. මෙවැනි උතුම් වූ බෝ සමිඳුන් වහන්සේ නමක් තම රටෙහි පිහිටා ඇති නිසා ඉමහත් ප්‍රීතියට පත් වූ රජ සතියක් පුරා බෝධි පූජා පැවැත්විය. අවසානයේ ආයුෂ කෙළවර වී රජතුමා තව්තිසා දෙව්ලොව දෙවිකෙනෙකුව ඉපදුණි.

එකල සක්විති කළිඟු රජු වූයේ ආනන්ද තෙරණුවෝ ය. මෙකල උන්වහන්සේට උපදෙස් දුන් අප සම්මා සම්බුදු රජාණන් වහන්සේ පුරෝහිත ලෙස රජුට උපදෙස් දුන්හ.

අප සම්මා සම්බුදු රජාණන් වහන්සේ ජීවමානව අපහට දකගත හැක්කේ උතුම් වූ ශ්‍රී මහා බෝ සමිඳුන්ගෙනි. අපි ශ්‍රී මහා බෝ සමිඳුන්හට වන්දනා මාන පැවැත්වීමට තරම් වාසනාවන්තයෝ වෙමු.

ඉපැදැ මෙ ලොවැ කිසි වෙසෙසක්
නො කොටැ මළොත් කිම විඳැ දුක්
කරනට වෙසෙසින් කිසිවක්
අකුරිනි ලැබෙතොත් පිහිටක්

ලොවට උපන්නේ පුත ඔබ
යම් කිසිවක් පිණිස යැ සුබ
එ සිදු කරන්නට ඉඩ ලැබ
ගත හැකි අකුරිනි සිත තබ

**කුමාරතුංග මුනිදාස පඬිතුමා**
(අකුරු මහිමයෙනි)



# අප යන්නේ කොයි පාරේ

(ඉලෙක්ටොනික හසුනක් ඇසුරිනි)

**"මුතු සීයා" විසිනි**

අධ්‍යාපන සුදුසුකම් විශිෂ්ට ලෙස ලබා ඇති තරුණයෙක් විශාල ව්‍යාපාරයක කළමනාකාර තත්ත්වයේ රැකියාවකට ඉල්ලුම් කළේ ය.

ඔහු පළමු සම්මුඛ පරීක්‍ෂණයෙන් පහසුවෙන් ම සමත් විය. දෙවැනි හා අවසාන පරීක්‍ෂණය පවත්වන ලද්දේ එම සමාගමේ අධ්‍යක්‍ෂක විසිනි. තරුණයා ගේ අධ්‍යාපන සුදුසුකම් පරීක්‍ෂා කළ සමාගමේ අධ්‍යක්‍ෂකට , ඔහු ආරම්භයේ ද්විතීයික පාසලේ සිට දිගට ම පශ්චාත් උපාධි පර්යේෂණය දක්වා අධ්‍යාපන විශිෂ්ටත්ව ලබා ඇති බව පෙනී ගියේ ය. කවර වසරක වත් කිසි ම පසු බෑමක් පෙන්වා නැත.

''ඔබ පාසලේ දී ශිෂ්‍යත්ව ලබා ගත්තෙහි ද?

සම්මුඛ පරීක්‍ෂණයේ දී අධ්‍යක්‍ෂක ගේ මුල් ම ප්‍රශ්නය විය.

''නැත. කිසිදු ශිෂ්‍යත්වයක් නො ලදිමි '' තරුණයා ගේ පිළිතුර විය.

''එසේ නම් ඔබ ගේ අධ්‍යාපනය සඳහා වියදම් කළේ ඔබ ගේ පියා ද?''

''නැත මහත්මයාණෙනි, මාගේ පියා අභාවප්‍රාප්ත වී ඇත්තේ මගේ වයස අවුරුදු එකේ දී. මා ඇති දැඩි කරමින්

අධ්‍යාපනය සඳහා සියලු වියදම් කර ඇත්තේ මගේ මවයි ''

''ඔබේ මව රැකියාව කළේ කවර ආයතනයක ද?''

''මගේ මව රැකියාව කළේ රෙදි සෝදන්නියක ලෙස යි''

''කෝ බලන්න ඔබ ගේ අත් දෙක?''

තරුණයා තම මට සිලිටි සුමුදු පිරිසිදු අත් ල යුවල අධ්‍යක්ෂකට පෙන්වී ය.

''රෙදි සේදීමට ඔබ කෙදිනක හෝ උදවු කළා ද?''

''නෑ කවදාවත් නැහැ. මට ඉඩ දුන්නේ ම නැහැ. ඇය හැම විට ම කීවේ, පාඩම් කරන්න, පොත්පත් බලන්න කියා යි. එපමණක් නෙවි, ඇයට යසට රෙදි සෝදන්නත් පුළුවනි''

''මේ අහන්න, මා ඔබගෙන් එක ඉල්ලීමක් කරනවා. 'අද නිවසට ගිය වහා ම මව ගේ අත හොඳට සෝදන්න. ඊට පසු හෙට උදේට ඇවිත් මාව හමුවන්න.''

මේ වදන් ඇසීමෙන් රැකියාව ලැබීමේ බලාපොරොත්තු ඇති කර ගත් තරුණයා සතුටින් නිවසට ගොස් අධ්‍යක්ෂකතුමා ගේ අදහස සිය මවට පැවසුවේ ය.

මව අමුතු වූ සතුට ද මිශ්‍ර හැඟීමෙන් යුතු ව සිය දෑත් සේදීමට පුතාට අවසර දුන්නා ය. පුතා ද මව ගේ දෑත් ඉතා සෙමින් ඕනෑකමින් හොඳින් සෝදා පිරිසිදු කරන්නට පටන් ගත්තේ ය. ඔහු ගේ දෑසින් මව ගේ දෑතට කඳුළු බිඳු වැටෙන්නට විය. මේ රැලි වැටුණු, කර ගැට සහිත දෑත් පළමු වරට ඔහු දුටුවේ එදා ය. ඔහු ගේ සේවා ගාස්තු කුවිතාන්සු වූයේ සෝදන විට වේදනාව ලබා දුන් මව ගේ අතේ පලින් පල තුබුණු තුවාල ය. සමහර තුවාල කොතරම් වේදනාකරද යත්, ඒවා සෝදන විට මව වේදනාවෙන් සැලෙන්නට විය.

තම පාසල් සේවා පහසුකම් ගාස්තු ගෙවීමට , උපාධියට ඉගෙනුමට හා විශිෂ්ට වූ අධ්‍යාපනයක් ලබා දීම සඳහා වැය කිරීමට මුදල් ඉපැයීමට දිනපතා ම රෙදි සේදුවේ මේ රත්තරන්

දැතින් බව ඔහු පළමු වරට අවබෝධ කරගත්තේ ඒ අවස්ථාවේ දී ය. ගෙවන ලද ඒ මුදල්වලට ලැබී ඇති කුවිතාන්සි වූයේ කරගැට ය. ඒ තුවාල සලකුණු ය.

මව ගේ අත සෝදා නිම කිරීමෙන් අනතුරු ව ඒ වන විට සෝදා නොතුබුණු සියලු ම රෙදි ඔහු සියතින් සෝදා නිම කෙළේ ය. එදා මුළු රැය ම වාගේ දෙදෙනා කතා බහින් ගත කළහ.

පසු දා උදෑසන එම තරුණයා අධ්‍යක්ෂකතුමන් ගේ කාර්යාලයට ගියේ ය. තරුණයා ගේ දෑසෙහි කඳුළු රැඳී ඇති බව අධ්‍යක්ෂකතුමන් දුටුවේ ය.

'තරුණය, පෙර දින ඔබ නිවසේ දී කළේ කුමක් ද? උගත්තේ මොනවා ද?

''මම අම්මා ගේ දෑත් සේදුවෙමි. ඉන්පසු ඉතිරි ව තුබූ සියලු ම රෙදි සෝදා නිම කෙළෙමි.''

''හොඳයි මට අවංක ව කියන්න ඊයේ ඔබට ඇති වූ හැඟීම්''

''ඇගයීම කුමක් දැයි ඊයේ හරි හැටි හඳුනා ගතිමි. මගේ මව නොසිටින්නට සාර්ථකත්වයට පත් මා වැන්නකු රටට බිහි නො වන්නට ද ඉඩ තිබිණි. මව සමග එකට වැඩ කිරීමෙන් කිසියම් කාරියක් ඉටු කිරීමේ දී මතු වන දුෂ්කරතාවන් ගැන ද අවබෝධයක් ලබා ගැනීමට අවසරයක් ලැබුණා. ඒ වාගේ ම පවුලේ සබඳතාවන්හි ඇති වැදගත්කම මෙන් ම අගය ද වටහා ගැන්මට අවස්ථාවක් සැලසුණා.''

හරියට හරි ! මගේ කළමනාකාරවරයකු ගෙන් මා බලාපොරොත්තු වන්නේ ද ඔන්න ඔය ටික ම යි. ඔන්න ඔය දැනුමයි. මට මාගේ සේවාවට බඳවා ගන්නට අවශ්‍ය වන්නේ ඔන්න ඔවැනි අන් අය ගේ උදවු උපකාර අගයන, අන් අය ගේ දුක් වේදනා හඳුනාගෙන අන් අය ගේ සේවා ලබා ගැන්මට හැකි, ධනය ම තම එක ම ජීවිතාපේක්ෂාව

වශයෙන් නො සලකන්නෙකුයි. එබැවින් ඔබ මගේ සේවාවට බඳවා ගනිමි''

සේවයට තෝරා ගන්නා ලද ඔහු ආයතනයට කැප වී ඉතා මහන්සියෙන් කටයුතු කළ අතර තමන් යටතේ සේවය කළවුන් ගේ ප්‍රසාදය දිනා ගති. ආයතනය ද දියුණුවට පත් විය.

එ ම නිසා දෙමාපියවරුනි,

දරුවකුට තමන් ඉල්ලන සෑම දෙය ම පුරුද්දට වාගේ සැපයුවොත් 'ඉල්ලන සෑම දෙය ම ලැබීමේ මානසිකත්වයක් ' ඔහු ගොඩ නඟා ගනී. යමක් ඔහු ඇරඹුවොත් කවුරුත් එයට එකඟ විය යුතු ය. කවුරුත් ඔහුට සවන් දිය යුතු වෙති. එවිට ඔහු නිවසෙහි කළමනාකරු වෙයි. ඔහුට සේවක දුක් වේදනා අවබෝධ නොවේ. මෙවැන්නෝ තම දැනුම නිසා සුළු කාල සීමාවක් තුළ සාර්ථක වුව ද, අවසාන තෘප්තිය නො ලබති.

ඔබ දරුවන් ආරක්ෂා කරන හුරතල් කරන අම්මා කෙනෙකු හෝ තාත්තා කෙනෙකු වුව හොත් ඇත්තෙන් ම එය හුරතල් කිරීමක් ද?

ඔවුනට සැපවත් ජීවිතයක් ගත කරන්නට විශාල නිවසක්, ඔවුන් කැමති ආහාරපාන , පුළුල් තිර ඇති රූපවාහිනියක්, වාදනය කිරීමට පියානෝවක් සපයනවා මෙන් ම ඔබ මිදුලේ තණ කොළ කපන විට ඔවුන් ද සහාය කර ගන්න. ආහාර ගැනීමෙන් පසු ඔවුන් කෑම කන පිඟාන වතුර බොන කෝප්පය ඔවුනට ම සෝදා පිරිසිදු කර ගන්නට ඉඩ සලසන්න. ඒ, මේ සඳහා වැටුප් දී සේවිකාවක ලබා ගත නොහැකි නිසා නොවේ. කෙතරම් පොහොසත් වුව ද කවදා හෝ මේ මුල දී සඳහන් කැරුණු මව ගේ මෙන් තම මවගේත් කෙස් පැහෙන බැවිනුත් සම රැලි වැටෙන බැවිනුත් ය. ඉතාම වැදගත් කරුණ වනුයේ සෙස්සන් සමඟ කටයුතු කිරීමට සහ අන්‍යයන් ගේ කටයුතු ඇගයුමටත් ඔබ දරුවන් ඉගෙන ගන්නා හෙයිනි.

*From :Dhammapada – V 42*

# NANDAGOPALA –
# THE COWHERD MEETS AN UNTIMELY END

Compiled by
**Srima Warusawithana** - Calgary, Canada

A simple cowherd – Nandagopala was his name
Working hard for his master the feeder of the poor – Anathapindika;
He was no common man – a store of riches he had and with it
humility too;
His wealth spent wisely to offer gifts to the Buddha and the bhikkhus,
With pure heart and faith unshaken;
Anathapindika too was impressed by Nandagopala's generous ways.
Then one day the Buddha visited his home for a noonday meal
And thereafter expounded the Dhamma, whence Nandagopala
Whose mind was focussed and mature enough to understand,
Attained the first stage of sanctity – sotapatti;
But on his way back home having followed the Buddha and the bhikkhus
Back to the monastery, a huntsman's arrow pierced his heart
And the good man collapsed – his life had come to an end.
The monks approached the Buddha, asked why and how it should be so;
The Buddha answered setting their minds at rest;
Nandagopala suffered the ill effects of a past kamma
But have no doubts – the Buddha said about Nandagopala
He had attained the fearless stage – no birth in woeful states
Shall he suffer ever again;
A stream winner is he – sure of the end
To the cycle of birth and death forever.
Whatever a foe may do to a foe – or haters to those they hate,
The ill-directed mind indeed – can do one, greater harm.